ධීවර ත්‍යාග අරමුදල -2025
------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර ත්‍යාග අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- • ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 දෙසැම්බර් 31 දිනට ත්‍යාගලාභීන්ට හා රජයේ දායකත්වය ලෙස ගෙවිය යුතු වටිනාකම මුදල් පොත අනුව රු.14,766,706 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.10,171,913 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.4,594,793 ක නොසැසඳීමක් පැවතුණි. එම වෙනස තුළ පැවති හඳුනානොගත් ශේෂයන් සහ රාජ්‍ය භාගය හඳුනාගෙන නිරවුල් කිරීමට හා ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි. තවද, 2025 වර්ෂයට අදාළ රු.2,449,081ක රජයේ දායකත්වය සහ පෙර වර්ෂවලට අදාළව රජයේ ආදායමට බැර නොකළ රාජ්‍ය භාගයද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වගකීම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | රු 4,594,793 ක නිශ්චිතව හඳුනා නොගත් ශේෂය 2021 වර්ෂයට පෙර වර්ෂයන්ගේ ධීවර ත්‍යාග අරමුදලට බැර වී ඇති මුදල්වලින් එක් එක් නීති කෘත්‍යයන්ට අදාළව නිලධාරින්ට ගෙවිය යුතු දීමනා ශේෂ නිශ්චිතව හඳුනා ගැනිමට නොහැකි වීම හා රජයේ ආදායමට බැර කළයුතු ශේෂ නිවැරදිව හඳුනා ගැනීමට නොහැකිවීම යන කරුණු මත පවතින අතර මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | එක් එක් නීති කෘත්‍යයන්ට අදාළව නිලධාරින්ට ගෙවිය යුතු දීමනා ශේෂ හා රජයේ ආදායමට බැර කළ යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයට අදාළව නිලධාරීන්ට ත්‍යාග ගෙවීම සඳහා අධිකරණවලින් ධීවර ත්‍යාග අරමුදල වෙත ලැබී තිබූ නමුත් ගෙවා නොතිබූ රු.423,612ක මුදල ගෙවිය යුතු ත්‍යාග දීමනා ගිණුම හා සමුච්චිත ත්‍යාග අරමුදල් ගිණුම අතර | 2019 ජනවාරි 01 දිනට ධීවර ත්‍යාග අරමුදලේ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂය රු 3,409 කි. ඒ අනුව 2015 වසරට අදාලව ලැබී ඇති රු.344,660 ක මුදල | අදාළ ගිණුම් අතර නිවැරදි ගැළපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂයන් දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| නිසි පරිදි ගැළපීමක් සිදුකර නොතිබීම හේතුවෙන්, සමුච්චිත ත්‍යාග අරමුදල් ගිණුම රු.423,612කින් අධිප්‍රමාණය වී හා ගෙවිය යුතු ත්‍යාග දීමනා ගිණුම එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | නිලධාරින්ට ගෙවිය යුතු දීමනා ගිණුමේ ඒ වර්ෂයේදී සටහන් කර නොමැති බැවින් හා මෙය ගැලපිය හැකි වෙනත් සුදුසු ගිණුමක් නොමැති බැවින් එම මුදල ධීවර ත්‍යාග අරමුදල් ගිණුමට ගැලපීම් කරන ලදි. |

## 1.6.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(2) වගන්තිය | (අ) | ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වුවද, 2018 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලසුම්වල ත්‍යාග අරමුදලේ අරමුණු හා කාර්යයන් හඳුනාගෙන ඒවා ඵලදායීව ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් හා ඉලක්ක ඇතුළත් කර සැලසුම් සකස් කර නොතිබුණි. | වැටලීම් හා පරීක්ෂා කිරීම් වලදී හඳුනාගනු ලබන වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම් සිදු කරනු ලැබේ. එවැනි නඩු පැවරීම්වලදී චූදිතයින් වරද පිළිගැනීමෙන් දඩ මුදල් නියම වීම සිදු වුවද, එම දඩ මුදල් ධීවර ත්‍යාග අරමුදලට බැර නොවේ. සමහර නඩුවලදී පමණක් අධිකරණ තීන්දුවට අනුව රාජසන්තක කරනු ලබන භාණ්ඩ සහ මසුන් වෙන්දේසිකර ලැබෙන මුදල් ත්‍යාග අරමුදලට බැර කරනු ලැබේ. එබැවින්, නඩුවලදී ධීවර ත්‍යාග අරමුදලට බැර වන මුදල් පිළිබඳව පූර්ව නිගමන වලට එළඹීම අපහසු වේ. | අරමුදලේ අරමුණු හා කාර්යයන් පදනම්කර ගනිමින් ඒවා ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස් කළ යුතුය. |
| | (ආ) | 2025 දෙසැම්බර් 31 දිනට වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා ලෙස රු.10,171,913 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා තිබූ අතර ඉන් රු.4,225,976 ක් සමාලෝචිත වර්ෂයට අදාළවද, රු.5,945,937 ක් 2014 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් ද විය. තවද, 2025 වර්ෂයේ දී ගොනුකළ නඩු 713 න් නඩු 06 කට අදාලව රු. 345,635 ක් අරමුදල වෙත ලැබී තිබුණද, එම | 2025 වර්ෂය සඳහා නඩු 713 ගොනු කල තිබුණ ද නඩු 48 කට අදාළව පමණක් වෙන්දේසි අදායම බැර වී තිබුණි. දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින් පවරන නඩු කටයුතු අවසන් වන අවස්ථාවේදී රාජසන්තක කරනු ලබන තැන්පත් මුදල් මසක් ඇතුළත ධීවර ත්‍යාග අරමුදලට බැර කළ යුතු බවත් වැටලීම් සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ නම් එම අවස්ථාවේදීම ලබා ගන්නා ලෙසත් චක්‍රලේඛ | නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකසා නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීම සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ට කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණි. ඒ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීමක් සිදුනොවන බව නිරීක්ෂණය විය. | අංක DFAR/INV/2024/01 හා 2024 ජූලි 19 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් සියලු දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂකවරුන් වෙත විධිමත්ව දැනුවත් කර ඇත. DFAR/INV/08/RF/2025 හා 2025 ජූලි 02 ලිපිය මඟින් වැටලීම් සඳහා දායක වන වෙනත් ආයතන නිලධාරීන්ට ත්‍යාග ලබා ගැනීම සම්බන්ධව විධිමත්ව දැනුවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,449,081 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 142,948 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,306,133 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේදී රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2026 අප්‍රේල් 06 දින විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව, නීති විරෝධී ධීවර කටයුතු සම්බන්ධයෙන් 2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් ධීවර කාර්යාල 08ක් වෙනුවෙන් සැලසුම් කර තිබූ වාර්ෂික වැටලීම් හා අත්අඩංගුවට ගැනීම් ඉලක්ක 320ක් අතරින් ඉටුකර තිබුණේ ඉලක්ක 169ක් පමණක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, අදාළ දිස්ත්‍රික් කාර්යාල අනුව ඉලක්ක සපුරා නොගැනීමේ ප්‍රතිශතය සියයට 23 සිට සියයට 95 දක්වා වූ පරාසයක පැවති අතර, සැලසුම් කළ ඉලක්ක හා තත්‍ය කාර්යසාධනය අතර සැලකිය යුතු පරතරයක් පැවති බව නිරීක්ෂණය විය. | පුහුණු නිලධාරීන් නොමැති වීම, නිලධාරීන් විදෙස් ගත වීම, නව නිලධාරීන් බඳවා නොගැනීම යන හේතූන් මත වැටලීම් සිදු කිරීම සඳහා නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉලක්ක සපුරා ගත නොහැකි වීම සහ ධීවර ත්‍යාග අරමුදලට අදාළ ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොලැබීම යන කරුණු මත මෙම ප්‍රතිශතයන් වෙනස් වීම සිදු වී ඇත. | මානව සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපුරාලීමට කටයුතු කරමින්, දිස්ත්‍රික් ධීවර කාර්යාල මට්ටමින් වැටලීම් හා අත්අඩංගුවට ගැනීම් ඉලක්කවල ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2025 ජනවාරි 01 දිනට පැවති රාජසන්තක කළ මසුන් අලෙවි කිරීමෙන් ලැබිය යුතු රු.1,984,300ක ආදායම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අයකරගෙන නොතිබූ අතර, අදාළ හිඟ ආදායම් ශේෂයන් අධිකරණ මඟින් සනාථ කර ගැනීමේ ක්‍රියාවලියද මන්දගාමී මට්ටමක පැවතුණි. | 2025 දෙසැම්බර් 31 දිනට අධිකරණ වලින් ලැබිය යුතු රාජසන්තක කළ මසුන් අලෙවි අදායම් ශේෂ සනාථ කර ගැනීම සඳහා ඒ පිලිබඳව සියළුම සහකාර අධ්‍යක්ෂකවරුන් හට ලිපි මඟින් දැනුම් දී ඇත. | අධිකරණ මඟින් ලැබිය යුතු හිඟ ආදායම් ශේෂයන් කඩිනමින් සනාථ කරගෙන අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 වෙනත් කරුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නීති විරෝධි ධීවර කටයුතු සිදුවන විට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන අත්අඩංගුවට ගැනීම් ද, ඔත්තු ලැබීම් හරහා මෙහෙයුම් කටයුතු සිදුකරන නිලධාරීන් ද, දිස්ත්‍රික් ධීවර කාර්යාලවල සෝදිසි මෙහෙයුම් කරන නිලධාරීන් ද, හඳුනාගත හැකිවන ආකාරයට අවශ්‍ය තොරතුරු විධිමත්ව ලේඛනගත කර ත්‍යාග ගෙවීම් කඩිනමින් කළ යුතු වුවත් එවැනි ලේඛනගත කිරීමක් සිදුකර නොතිබුණි. තවද, ත්‍යාග ලබාගැනීමේ ක්‍රමවේදය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මඟින් නීති විරෝධී ධීවර කටයුතු පිළිබඳ තොරතුරු ලබාගැනීම හා වැටලීම් වැඩිදියුණු කිරීමටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>එමෙන්ම, 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(1) වගන්තිය යටතේ නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීමේ අරමුණින් අරමුදල පිහිටුවා තිබුණද, අරමුදලේ එම අරමුණ ඵලදායී ලෙස ඉටුවන පරිදි ත්‍යාග ගෙවීම් හා තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය. | වැටලීම් සඳහා සහභාගී වන නිලධාරීන් හා ඔත්තු කරුවන් හඳුනාගැනීම සඳහා ලේඛනයක් නිවැරදිව පවත්වාගෙන යන ලෙස හා රික්විසිෂන් පත්‍රවල අත්සන් ලබා ගන්නා ලෙස දැනුවත් කිරීම් කර ඇත.<br>තවද, ඔත්තුකරුවන් හඳුනාගැනීම හා ඔත්තු ලබාදීම සඳහා, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක වෙත හෝ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සෘජුවම තොරතුරු ලබාදීම සඳහා හැකියාව ඇති අතර ඒ පිළිබඳව සියළුම දිස්ත්‍රික් කාර්යාල හරහා දැනුවත් කිරීම් සිදු කරන ලදී. | අරමුදලේ අරමුණ වන නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් හා ඔත්තුකරුවන් දිරිගැන්වීම ඵලදායීව ඉටු වන පරිදි තොරතුරු ලේඛනගත කිරීම හා ත්‍යාග ගෙවීමේ ක්‍රමවේදය විධිමත් කළ යුතු අතර, ත්‍යාග ක්‍රමය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමටද කටයුතු කළ යුතුය. |